හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දිනද විගණනයට විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 25 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

(අ). සමාලෝචිත වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවලට අදාලව ලැබිය යුතු රු.1,307,550 ක මුද්දර ගාස්තු රු.2,615,100 ක් ලෙසට ණයගැතියන්ට හරකිරීම නිවැරදි කිරීම සඳහා ණයගැතියන් රු.1,307,550 ක් බැරකල යුතු වුවද, එම මුදල ණයහිමියන්ට බැරකර තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.46,000 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමට වරදවා බැරකිරීම නිවැරදි කිරීමට එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හරකල යුතු වුවද රු.92,000 ක් හරකර තිබුණි. එමෙන්ම මුදලින් ලැබී තිබුණු රු.46,000 ක මුද්දර ගාස්තු වරදවා ණය ගැතියන්ට බැරකර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් රු.1,307,550 ක් වැඩියෙන්ද වසරේ ආදායම රු.46,000 ක් අඩුවෙන්ද, ණයගැතියන් රු.1,261,550 ක් වැඩියෙන්ද ගිණුම්වල දැක්වේ.

(ආ). සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළව උසාවි දඩ රු.29,834 ක් වැඩියෙන් ආදායමට බැරකර තිබුණු බැවින්, එය නිවැරදි කිරීම සඳහා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම හරකර ණයගැතියන් බැරකළ යුතු වුවද, වසරේ ආදායම රු.59,656 ක් හරකර සමුච්චිත අරමුදල රු.59,656 ක් බැරකර තිබුණි. මේ හේතුවෙන් වසරේ ආදායම රු.29,822 ක් අඩුවෙන්ද, සමුච්චිත අරමුදල රු.29,822 ක් වැඩියෙන්ද දැක්වේ.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.11,915,631 ක් වුවද, එය රු.11,538,053 ක් ලෙසට රු.377,578 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ශේෂය රු.2,907,794 ක් වුවද, එම ශේෂය රු.1,160,432 ක් ලෙසට රු.1,747,362 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු ශේෂය රු.4,613,842 ක් වුවද, එම ශේෂය රු.2,218,065 ක් ලෙසට රු.2,395,777 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

1.3.2. නොසැසඳූ පාලන ගිණුම්
-----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය, සේවක ණය ගිණුම අනුව රු.1,963,757 ක් වුවද, සේවක ණය ලේඛනය අනුව එම ශේෂය, රු.1,900,734 ක් වූයෙන් රු.63,023 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3. ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.43,679,766 ක් වූ අතර, ඉන් රු.34,362,237 ක් වසරක කාලයක් ඉක්මවා අය නොවී පැවතුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු ගිණුම් ශේෂවල වටිනාකම රු.32,600,754 ක් වූ අතර, ඉන් රු.23,264,468 ක් වසර 01 ක කාලයක් ඉක්මවා ගෙවිය යුතුව තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂයය | වසර 01ට අඩු ශේෂය | වසර 01ට වැඩි ශේෂය | 2016.12.31 දිනට මුළු ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කර්මාන්ත ණය හිමියෝ | 9,231,675 | 17,985,281 | 27,216,956 |
| විශ්‍රාම වැටුප් දායක මුදල් | 104,611 | 5,279,187 | 5,383,798 |
| | 9,336,286 | 23,264,468 | 32,600,754 |

1.3.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති එකතු වටිනාකම රු.32,816,279 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5. නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 150 - 166 වගන්ති | රු.6,417,784 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| 571 (2) | රු.29,600 ක කල් ඉකුත් වූ තැන්පතු 21 ක් සම්බන්ධයෙන් අදාල කටයුතු කර නොතිබුණි. |
| (ඇ). ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදය | විශ්‍රාම ගිය/ මියගිය/ සේවය අත්හැර ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්/ සේවකයින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.159,112 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,962,267 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,872,766 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,089,501 ක වර්ධනයක් සිදුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,089,501 ක වර්ධනයට ආදායම් විෂයයන් 03 ක ආදායම් වැඩිවීම සහ එක් වියදම් විෂයක වියදම අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3. ආදායම් පරිපාලනය
-----------------------

2.3.1. වරිපනම් බදු.
--------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු ආදායම රු.4,638,011 ක් වූ අතර ඉන් රු.3,496,256 ක් වසර 1කට වඩා අධික කාලයක් අයනොවී පැවතුණි.

2.3.2. බදුකුලී

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බදුකුලී ආදායම රු.129,603 ක් වූ අතර ඉන් රු.110,950 ක් වසර 1 කට වඩා අධික කාලයක් අයනොවී පැවතුණි.

2.3.3. උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.817,220 ක් සහ මුද්දර ගාස්තු රු.6,119,700 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය.

-----------------------------

3.1. ප්‍රාග්ධන වියදම්.

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභාවේ පොදු අරමුදලින් දැරීමට යෝජිත ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රු.3,711,400 ක් වුවද, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.813,604 ක් විය. මේ අනුව අයවැය ගත ප්‍රාග්ධන වියදමෙන් රු.2,897,796 ක උපයෝජනය කර නොතිබුණු අතර, එම උපයෝජනය නොකළ ප්‍රමාණය අයවැයගත ප්‍රාග්ධන වියදමෙන් සියයට 78 ක් විය.

3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා.

------------------------------------

(අ). 2015 ඔක්තෝබර් 28 දිනැති අධිකරණ තීන්දුවක් අනුව පළාත් පාලන සේවක මහා සංගමයෙන් සභාවට අයකරගත යුතු රු.54,000 ක මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ). 2012 සිට 2016 වර්ෂය දක්වා කාලය තුල නිකුත් කර තිබුණු ගොඩනැගිලි ඉදිකිරීම් අවසර පත් වලින්, ගොඩනැගිලි 197 ක් සඳහා නිකුත් කර තිබුණු අවසර පත්‍ර වලට අදාල ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණ පවත්වා හෝ යෝග්‍යතා සහතික නිකුත් කර හෝ නොතිබුණි. මේ හේතුව නිසා වරිපනම් ගාස්තු අයවිය යුතු ගොඩනැගිලි හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ). සභාවට අයත් හඳවලපිටිය සහ ඇකිරිය පුස්තකාල මනාව නඩත්තුකර නොතිබුණු අතර, ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතුද කර නොතිබුණි.

(ඇ). ආයුර්වේද මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i). සභාවට අයත් හඳවලපිටිය ආයුර්වේද මධ්‍යස්ථානය වසර 08 ක පමණ කාලයක් මහජන අවශ්‍යතා සඳහා යොදා නොගෙන වසාදමා තිබුණි.

(ii). ඉඩම්පිටිය ආයුර්වේද මධ්‍යස්ථානය විධිමත්ව නඩත්තුකර නොතිබුණු අතර, මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ආරක්ෂක වැට සහ ගේට්ටුව අබලන්ව පැවතුණි. එමෙන්ම මධ්‍යස්ථානයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විවිධ උපකරණ වලද අඩුපාඩු පැවතුණි.

3.3. නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

(අ). සභාවට අයත් මෝටර් ග්‍රේඩරයක් සහ ජල බවුසරයක් 2015 වර්ෂය ආරම්භයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා භූමියේ ගාල්කර තිබුණි.

(ආ). වසර 05 කට අධික කාලයක් භාවිතයෙන් ඉවත්කර ඇති හොන්ඩා වර්ගයේ යතුරු පැදිය හා කුබෝටා වර්ගයේ රෝද 04 ට්‍රැක්ටරය සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
-----------------------------------

(අ). මැතගම අස්පත්තිය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට සභා බල ප්‍රදේශය තුළ පිහිටි හඟුරන්කෙත, රිකිල්ලගස්කඩ සහ පදියපැලැල්ල යන නගර වලින් රැගෙන එන කසළ විධිමත්ව කළමනාකරණය නොකර කසල වල අඩංගු පොලිතීන් ගිනිතබා විනාශ කිරීමද, දිරායන කසල කොටස් සමග මිශ්‍රවී තිබෙන ඇතැම් පොලිතීන්ද, එම දිරායන කසල කොටස් සමඟ පස් දමා වැසීමද කෙරෙමින් පැවැතුණි.

(ආ). හේවාහැට නගරයේ එකතු වන ඝන අපද්‍රව්‍ය වර්ග කිරීමකින් තොරව නගරය අසල පිහිටි ස්ථානයකට බැහැර කරන අතර, ඒවා පස්දමා වසා දමන බැවින් පස හා ජල මූලාශ්‍ර දූෂණය වීමද, පොලිතීන් පිලිස්සීම නිසා වායු දූෂණයද සිදු වෙමින් පැවතුණි.

(ඇ). මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 ජූලි 27 දිනැති "ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් ලබාදීමේ ව්‍යාපෘතිය - 2016" මැයෙන් නිකුත් කර ඇති ලිපිය අනුව කොම්පෝස්ට් බඳුන් 140 ක් මිලදී ගෙන තිබූ අතර ඉන් පිරිවැය රු.431,108 ක් වූ බඳුන් 118 ක් බල ප්‍රදේශයේ ජනතාවට නිකුත් නොකර 2017 පෙබරවාරි 27 විගණන දින වන විටද, ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ තබා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 07 ක සියයට 09 සිට සියයට 87 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 17 සිට සියයට 60 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය.

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය. | සභාවට ලැබිය යුතු මුදල් නිරවුල් කර නොගැනීම සහ සභාව විසින් ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කර නොතිබීම. |
| (ඇ). | වත්කම් පාලනය. | සභාවට අයත් පුස්තකාල සහ ආයුර්වේද ගොඩනැගිලි මනාව නඩත්තුකර නොතිබීම. |
| (ඇ). | ගිණුම්කරණය. | ගිණුම් වර්ෂයට අදාළ වත්කම් සහ බැරකම් ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීමේදී විවිධ අඩුපාඩු සිදුවී තිබුණි. |